# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1036 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 |
| දිනය<br>திக<br>Date | 20/06/2024<br>පැය 1420 | | |

## මාධ්‍ය නිවේදනය

### ශ්‍රී නාගේන්ද්‍රාරාම විහාරස්ථානයේ මිහිඳු මහා පෙරහර හේතුවෙන් කටුනායක නිට්ටඹුව ප්‍රධාන මාර්ගය අවහිර වීම - වේයන්ගොඩ පොලිස් වසම.

වේයන්ගොඩ පොලිස් වසමේ ශ්‍රී නාගේන්ද්‍රාරාම විහාරස්ථානය මඟින් පොසොන් පෝය දිනට සමගාමීව සෑම වසරක් පාසාම පවත්වනු ලබන මිහිඳු මහා පෙරහර 2024.06.21 වන දින අති උත්කර්ෂවත් අන්දමින් පැවැත්වීමට නියමිතව ඇත. මෙම පෙරහර නැරඹීම සඳහා බැතිමතුන් විශාල ප්‍රමාණයක් හා අධික වාහන ප්‍රමාණයක පැමිණීම අපේක්ෂා කරනු ලබයි.

ඒ අනුව මෙම පෙරහර 2024.06.21 වන දින සවස 06.00 සිට මධ්‍යම රාත්‍රී 12.00 දක්වා කාලය තුල විහාරස්ථානයෙන් ආරම්භ වී වේයන්ගොඩ දුම්රිය හරස් මාර්ගය හරහා එළුවාපිටිය මෝල හන්දිය දක්වා ගමන් කර නැවත එම මාර්ගයේම විහාරස්ථානයට පැමිණීම සිදුවේ.

එම කාලය තුල නිට්ටඹුව කටුනායක ප්‍රධාන මාර්ගයේ අධික රථවාහන තදබදයක් ඇති විය හැකි බැවින් පෙරහර ගමන් ගන්නා කාලය තුල පහත විකල්ප මාර්ගයන් භාවිතා කරන ලෙස පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටී.

### විකල්ප මාර්ග

- නිට්ටඹුව කටුනායක ප්‍රධාන මාර්ගයේ කටුනායක දෙසට ධාවනය වන වාහන වේයන්ගොඩ නගරයේ ගුවන් පාලම මතින් ආර්ථික මධ්‍යස්ථානය දෙසට ඇති මාර්ගයේ ගුණසිරි සහබෝ විහාරස්ථානය අසලින් දකුණු දෙසට ඇති උඩුගම මාර්ගයේ උඩුගම හන්දිය දක්වා ගමන් කර ගම්පහ දිවුලපිටිය ප්‍රධාන මාර්ගයෙන් කටුනායක දෙසට පිටව යා හැක.

- කටුනායක සිට නිට්ටඹුව දක්වා ගමන් ගන්නා වාහන නයිවල හන්දියෙන් දකුණට හැරී උඩුගම්පල දෙසට ගමන් කර මාරපොල ලී මෝල අසලින් වමට ඇති මාර්ගයේ මගලේගොඩ හරහා වේයන්ගොඩ කළුගෙඩිහේන මාර්ගයට පිවිස දකුණට හැරී කළුගෙඩිහේන දක්වා ගමන් කර නිට්ටඹුව දෙසට ගමන් කල හැකිය.

මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය
පොලිස් මාධ්‍ය කොට්ඨාසය